# මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk


| | |
|---|---|
| නිකුත් කළේ | සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව |
| දිනය | 2021 ඔක්තෝම්බර් මස 14 දින |

**මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුව නැවත ස්ථාපිත කෙරේ.**

2021 ඔක්තෝම්බර් මස 06 වන දින සිට බලපැවැත්වන පරිදි මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුව (FSSCC), මූල්‍ය අංශයේ ප්‍රවීණයන් කිහිපදෙනෙකුගෙන් සමන්විත වන පරිදි නැවත ස්ථාපිත කරන ලදි. ලංකාක්ලියර් පුද්ගලික සමාගමෙහි සභාපති, ආචාර්ය කෙනෙත් ද සිල්වා මහතා මෙම කමිටුවේ සභාපති වශයෙන් පත් කොට ඇත. තවද, ශ්‍රී ලංකා මූල්‍ය සමාගම් සංගමයේ සභාපති, නිරෝෂන් උඩගේ මහතා; ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂක/ සාමාන්‍යාධිකාරී; සී. එන්. එස්. එන්. ඇන්තනි මහතා; ශ්‍රී ලංකා බැංකු සංගමයේ සභාපති, එල්. එච්. ඒ. ලක්ෂ්මන් සිල්වා මහතා; ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස්හි කළමණාකාර හවුල්කරු, සුජීව මුදලිගේ මහතා; ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ උප සභාපති, සංජය බණ්ඩාර මහතා; ලංකා වාණිජ මණ්ඩලයේ සභාපති, විශ් ගෝවින්දසාමි මහතා; ජනාධිපති නීතිඥ, කුශාන් ද අල්විස් මහතා; කොළඹ වරාය නගර ආර්ථික කොමිසමේ වැඩ බලන අධ්‍යක්ෂක ජනරාල්, සාලිය වික්‍රමසූරිය මහතා; එල්ඕඑල්සී හෝල්ඩින්ග්ස් පීඑල්සී හි සමූහ කළමණාකාර අධ්‍යක්ෂක, කපිල ජයවර්ධන මහතා සහ ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී හි සභාපති, ක්‍රිෂාන් බාලේන්ද්‍රන් මහතා නැවත පිහිටුවන ලද මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුවෙහි සෙසු සාමාජිකයින් වේ. මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාත්මක වන ඉහළ මට්ටමේ කමිටුවකි. එය මූල්‍ය පද්ධති ස්ථායිතාව සහ මූල්‍ය අංශයේ සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා මහ බැංකුවට සහාය වීම පිණිස අදහස් හා උපදෙස් ලබාදෙන සාකාච්ඡාවලට පහසුකම් සැපයීමේ අරමුණින් පිහිටුවන ලද්දකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්ත්මේන්තුව මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුවේ ලේකම් කටයුතු සිදු කරයි.



ආචාර්ය කෙනෙත් ද සිල්වා සභාපති, ලංකාකිලියර් පුද්ගලික සමාගම



නිරෝෂන් උඩගේ මහතා - සභාපති, ශ්‍රී ලංකා මූල්‍ය සමාගම් සංගමය



සී එන් එස් එන් ඇන්තනි මහතා - අධ්‍යක්ෂක/ සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය



එල්. එච්. ඒ. ලක්ෂ්මන් සිල්වා මහතා - සභාපති, ශ්‍රී ලංකා බැංකු සංගමය



සුජීව මුදලිගේ මහතා - කළමණාකාර හවුල්කරු, ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස්



සංජය බණ්ඩාර මහතා - උප සභාපති, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය



විශ් ගෝවින්දසාමි මහතා - ලංකා වාණිජ මණ්ඩලයේ සභාපති



කුශාන් ද අල්විස් මහතා - ජනාධිපති නීතිඥ



සාලිය වික්‍රමසූරිය මහතා - කොළඹ වරාය නගර ආර්ථික කොමිසමේ වැඩ බලන අධ්‍යක්ෂක ජනරාල්



කපිල ජයවර්ධන මහතා -
සමූහ කළමණාකාර
අධ්‍යක්ෂක, එල්ඕඑල්සී
හෝල්ඩින්ග්ස් පීඑල්සී



ක්‍රිෂාන් බාලේන්ද්‍රන් මහතා -
සභාපති,
ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස්
පීඑල්සී